# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2302/14 – 2022 ඔක්තෝබර් 18 වැනි අඟහරුවාදා – 2022.10.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/49/2013.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2016.02.03 දිනැති හා අංක 1952/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.01.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් වාද්දුව, මොල්ලිගොඩ, වසන්තාරාම පාර, අංක 08, හි පදිංචි ජී. කේ. පී. ජී. ප්‍රනාන්දු මයා සහ 1. කොළඹ 04, ඩික්මන් පාර, ස්ටබ් පෙදෙස, අංක 35/1 හි පිහිටි සෙලින්කෝ ලීසිං කෝපරේෂන් ලිමටඩ් 2. කොළඹ 08, අල්විස් ඇවනිව්, කාසල් වීදිය, අංක 174/3 හි පිහිටි සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් 3. කොළඹ 01, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 16 වන මහල පිහිටි සෙලින්කෝ ශ්‍රී රාම් සෙකියුරිටි ලිමිටඩ් (පසුව එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී) අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.23 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

ජී. කේ. පී. ජී. ප්‍රනාන්දු,
අංක 08, වසන්තාරාම පාර,
මොල්ලිගොඩ,
වාද්දුව.

පළමු පාර්ශ්වය

*නඩු අංක:* A/3625.
IR/10/49/2013.

එදිරිව

1. සෙලින්කෝ ලීසිං. කෝපරේෂන් ලිමිටඩ්,
   අංක 35/ 1, ස්ටබ් පෙදෙස, ඩික්මන් පාර,
   කොළඹ 04.

2. සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැණි,
   ප්‍රයිවට් ලිමිටඩ්, අංක 174/3,
   කාසල් වීදිය, අල්විස් ඇවනිව්,
   කොළඹ 08.

3. සෙලින්කෝ ශ්‍රී රාම් සෙකියුරිටීස් ලිමිටඩ්,
   (පසුව එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී. එල්. සී.)
   16 වන මහල, බටහිර කුළුණ,
   ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
   කොළඹ 01.

දෙවන පාර්ශ්වය

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2016 ජනවාරි මස 28 වන දින ආර්. එස්. ආරියප්පෙරුම වන මා පත්කර ඇත.

ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පරිදි කම්කරු ආරාවුලට හේතුවී ඇති කරුණ වනුයේ "සෙලින්කෝ ලීසිං කෝපරේෂන් ලිමිටඩ්, සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්මන්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, සෙලින්කෝ ශ්‍රී රාම් සෙකියුරිටීස් ලිමිටඩ් (පසුව එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී. එල්. සී.), යන ආයතනවල සේවය කළ ජී. කේ. පී. ජී. ප්‍රනාන්දු මහතාගේ සේවය 2010.03.31 දින සිට අවසන් කිරීම සම්බන්ධයෙන් වන්දි මුදල් හා පාරිතෝෂික මුදල් ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද? යන්න සහ එලෙස යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ".

උක්ත ආරාවුල පිළිබඳ පළමුවන හා දෙවන පාර්ශවයන්ට 2016.02.09, 2016.08.04 යන දිනයන්හි දන්වා ලිපි යවා ඇති නමුත් එම ලිපි යවන ලද ලිපිනයන් නිවැරදි නොවන බැවින් නිවැරදි ලිපිනයන් ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම්කරුට 2016.10.20, 2018.06.18, 2021.03.01, 2022.03.18 යන දිනයන්හි ලියාපදිංචි තැපෑලෙන් ලිපි යොමු කර ඇත. අවසන් ලිපියෙන් දන්වන ලද්දේ නඩුවට ඉල්ලුම්කරු උනන්දුවක් නොදක්වන්නේ නම් නඩුව පිළිබඳ ව උනන්දුවක් නොමැති ලෙස සලකා ආරාවුල නිරවුල් කිරීම නවතා දමන බව තීරණය කරන බවයි. එයට ද කිසිදු පිළිතුරක් ඉදිරිපත් කර නොමැත.
පළමු පාර්ශවය වන ඉල්ලුම්කරුගේ උනන්දුවක් නොමැතිව නඩුවක් පවත්වාගෙන යාමට මෙම බේරුම්කරණයට හැකියාවක් නොපවතින

බැවින් ඒ මත පළමු පාර්ශවයේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් මෙම නඩුව අවසන් කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ආර්. එස්. ආරියප්පෙරුම,
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 23 වැනි දින දී ය.

EOG 10 – 0164

---

මගේ අංකය: IR/10/49/2013(ii).

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2016.01.12 දිනැති හා අංක 1949/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2015.12.31 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කැකණදුර, තල්පාවිල, බදුවත්ත, ''මිහිරි'' හි පදිංචි යූ. එස්. එම්. පියුෂානි මිය සහ 1. කොළඹ 03, ආර්. ඒ. ද මෙල් මාවත, අංක 283 හි පිහිටි සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් 2. කොළඹ 03, ආර්. ඒ. ද මෙල් මාවත, අංක 283 හි පිහිටි සෙලින්කෝ ශ්‍රී රාම් කැපිටල් මැනේජ්මන්ට් සර්විසස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.23 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

යූ. එස්. එම්. පියුෂානි මිය,
''මිහිරි'', බදුවත්ත,
තල්පාවිල,
කැකණදුර.

පළමු පාර්ශ්වය

*නඩු අංක:* A/3614.
IR/10/49/2013(ii).

එදිරිව

1. සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැණි,
(ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 283, ආර්. ඒ. ද. මෙල් මාවත,
කොළඹ 03.

2. සෙලින්කෝ ශ්‍රී රාම් කැපිටල් මැනේජ්මන්ට්,
සර්විසස් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 283, ආර්. ඒ. ද. මෙල් මාවත,
කොළඹ 03.

දෙවන පාර්ශ්වය

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2015 දෙසැම්බර් මස 31 වන දින ආර්. එස්. ආරියප්පෙරුම වන මා පත්කර ඇත.

ආරවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පරිදි කම්කරු ආරවුලට හේතුවී ඇති කරුණ වනුයේ, සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, සෙලින්කෝ ශ්‍රී රාම් කැපිටල් මැනේජ්මන්ට් සර්විසස් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, යන ආයතනවල සේවය කළ යූ. එස්. එම්. පියුෂානි මහත්මියගේ සේවය 2009.12.31 දින සිට අවසන් කිරීම සම්බන්ධයෙන් වන්දි මුදල් ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්ති සහගතද? යන්න සහ එලෙස යුක්ති සහගත වන්නේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ''.

උක්ත ආරවුල පිළිබඳ පළමුවන හා දෙවන පාර්ශවයන්ට සිය පළමු ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම සඳහා විටින් විට ලිපි යවා ඇත. වගඋත්තර පාර්ශවයන්ගේ නිවැරදි ලිපිනයන් ලෙස විටින් විට එවා ඇති ලිපිනයන්ට ලියාපදිංචි තැපෑලෙන් ලිපි යවා ඇති නමුත් ඊටද නිවැරදි පිළිතුරක් නොමැත. 2021.03.24 වන දින ලිපිය මගින් යූ. එස්. එම්. පියුෂානි මිය සමඟ ඇති ආරවුල 2021.04.20 වන දින විභාග කරන බවත් ඊට අදාළව ඉදිරිපත් කළ හැකි සම්පූර්ණ විස්තර ප්‍රකාශනයක් තිබේ නම් එදිනට පෙර ඉදිරිපත් කරන මෙන් දන්වා ඇත.

නමුත් වගඋත්තරකරුවන්ගේ නිවැරදි ලිපිනයන් දන්වා එවන ලෙස 2021.04.09 හා 2022.03.18 යන දිනයන්හි ලිපි මඟින් ඉල්ලුම්කාරියට දන්වා ඇති නමුත් මෙම ලිපිවලට පිළිතුරු නොලැබුනහොත් පැමිණිලි පාර්ශවයේ මෙම නඩුව පිළිබඳව උනන්දුවක් නොමැති ලෙස සලකා ආරවුල නිරවුල් කිරීම නවතා දමන බව තීරණය කරන බව දන්වා ඇත. ඒ අනුව මෙම නඩුව අවසන් කරමි.

පළමු පාර්ශවය වන ඉල්ලුම්කරුගේ උනන්දුවක් නොමැතිව නඩුවක් පවත්වාගෙන යාමට මෙම බේරුම්කරණයට හැකියාවක් නොපවතින බැවින් ඒ මත පළමු පාර්ශවයේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් මෙම නඩුව අවසන් කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ආර්. එස්. ආරියප්පෙරුම,
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 23 වැනි දින දී ය.

EOG 10 – 0165

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.